# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1776/3 – 2012 සැප්තැම්බර් 17 වැනි සඳුදා – 2012.09.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2008/අයිආර්/174.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාවිස්ස කෝරළේ, ගබඩාගම දකුණ ග්‍රාම නිලධාරි වසමේ, ගබඩාගම පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.මහ. 6176 පිඹුරේ කැබලි අංක 1 - 3 දක්වා වූ ගලේ වත්ත හා ගලේ කුඹුර වශයෙන් හඳුන්වන ප්‍රමාණයෙන් හෙක්. 1.2275ක් වූ පහත දැක්වෙන ඉඩම්:

කැබලි අංක 01
ඉඩමේ නම: ගලේ වත්ත; හිමිකම් කියන අය: සීතා සිරිසේන, විජයබාහු කන්ද, රාවනාගොඩ, ඉලුක්කොටුව; ප්‍රමාණය: හෙක්. 0.3648.

කැබලි අංක 02
ඉඩමේ නම: ගලේ කුඹුර; හිමිකම් කියන අය: සීතා සිරිසේන, විජයබාහු කන්ද, රාවනාගොඩ, ඉලුක්කොටුව; ප්‍රමාණය: හෙක්. 0.6851.

කැබලි අංක 03
ඉඩමේ නම: ගලේ කුඹුර; හිමිකම් කියන අය: පියදාස සිරිසේන, අංක 413/8, හාරගම පාර, මාලිගාතැන්න; ප්‍රමාණය: හෙක්. 0.1776.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 නොවැම්බර් මස 21 වැනි දින පෙ.ව. 11.00 ට දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 නොවැම්බර් මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජේ. පී. යූ. කේ. ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2012 අගෝස්තු මස 28 වැනි දින,
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 87

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: හගු/3/2/1/84.

පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 495බී, යටිහඟුරන්කෙත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක නු 2807 හා 2012.06.11 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 දරන පහත විස්තර කරන ඉඩම:

**කැබලි අංක 01**

ඉඩමේ නම: මොණරපොල හේන; විස්තරය: ගෙවත්ත, තාවකාලික වගාවක් ඇත; හිමිකම් කියන අය: ආර්. එම්. සී. රත්නායක, සුනිල් නිවස, මා ඔය, හඟුරන්කෙත; ප්‍රමාණය: හෙක්. 0.0202.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 නොවැම්බර් මස 05 වැනි දින පෙ.ව. 10.00 ට හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ඔක්තෝබර් මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

2012 සැප්තැම්බර් මස 12 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
හඟුරන්කෙත.

10 - 123

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

අනුරාධපුර පාදෙනිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ 7 වැනි වගන්තිය ඇතුළත් *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* අංක 1705/30 හා 2011.05.13 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 3ඒ පිටුවේ සඳහන් කැබලි අංක 462 ඉඩමේ ප්‍රමාණය 0.0022 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. එස්. සේනාතිස්ස,
ප්‍රාදේශීය ලේකම්,
අඹන්පොල.

2012 සැප්තැම්බර් මස 13 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
අඹන්පොල.

10 - 124

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.